# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2364/16 - 2023 දෙසැම්බර් මස 27 වැනි බදාදා - 2023.12.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## හිමිකම් ලියාපදිංචි කිරීම

### සංශෝධන

**1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත**

(14 වන වගන්තිය)

උක්ත ශීර්ෂය යටතේ 2023 දෙසැම්බර් මස 11 වන දින අංක 2362/09 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 229/ඒ අළුත්ගම බෝගමුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අළුත්ගම බෝගමුව නමැති ගමේ පිහිටියා වූ ද, අංක 511800 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 01 හි කැබලි අංක 18 දරන ඉඩම් කොටස සම්බන්ධයෙන් එහි උපලේඛනයෙහි;

"හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්ගේ තීරණ ප්‍රකාශයේ සඳහන් කඩයිම් සිතියම් අංක 511800 යන්න ඉවත් කර 511801 යන්න සහ අයිති ඉඩමේ ප්‍රමාණය යන තීරුවෙහි සඳහන් සම්පූර්ණ යන්න ඉවත් කර සම්පූර්ණ ඉඩම් කොටසෙන් 1/2 අයිතිය යන්න ඇතුලත් කර සංශෝධනය කරනු ලැබේ."

**පී. සී. ඩී. සිංගේරා,**
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 21 වැනි දින,
බත්තරමුල්ල
රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර", අංක 1200/6,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

EOG 12-0376

1A - G 041123 - 06 (2023/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*